**දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------**

දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3027 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ ප්‍රතිපාදන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුවට වාර්ථා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දකුණු අධිවේගයට සම්බන්ධවන කිලෝමීටර් 33 ක මාර්ග පුනරුත්ථාපනය හා යාවත්කාලීන කිරීම තුලින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,248 කට සමාන එජඩො මිලියන 95 ක් වන අතර, එම මුදලින් රු.මිලියන 9,025 කට සමාන එජඩො මිලියන 70 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 27 දින ආරම්භ කළ අතර, 2018 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය.කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2019 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

**--------------------------**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**--------------------**

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 කළමනාකරණයේ වගකීම් සහ මූල්‍ය ප්‍රකාශණ පාලනය පිළිබඳ චෝදනා

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනය සම්බන්ධයෙන් චෝදනා ලද අය සතුවේ.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාරතා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණාකරණයේ අදහස් දැක්ම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ණය ගිවිසුමේ දෙවන වගන්තියේ 2.02 හා 2.03 ඡේදවල අනුව ණය දෙන ආයතනය විසින් ණය, පොලිය හා බැඳීම් ගාස්තු ලෙස රුපියල් මිලියන 220.94 ක මුදලක් අයකර ඇත. ව්‍යාපෘතිය විසින් එය මූල්‍ය ප්‍රකාශන තුල වෙන් වෙන් වශයෙන් හෙළිදරව්කර නොතිබුණි. | මග හැරීම | එකග වේ | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ සියළු වියදම් සංවේදනය කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතුවල භෞතික කාර්ය සාධනය

කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග 06 කට අයත් කිලෝමීටර් 33 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ 04 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු සැලසුම් කර ඇත. කොන්ත්‍රාත් පැකේජ 01 යටතේ ක්‍රියාත්මක කරන ලද මොරටුව - පිළියන්දල මාර්ගය සහ රත්මලාන - මිරිහාන මාර්ගයන් කිලෝමීටර් 4.64 ක පුනරුත්ථාපන වැඩ දින 248 ක ප්‍රමාදයක් සහිතව 2017 ජුනි 19 දින අවසන්කර තිබුණි. තවද මදුරුගොඩ සිට අධිවේගී මාර්ගය සම්බන්ධ කෙරෙන මාර්ගය කිලෝමීටර් 10.37 ක පුනරුත්ථාපන වැඩ කොන්ත්‍රාත් පැකේජ 03 යටතේ සම්පූර්ණකර 2018 නොවැම්බර් 28 දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණි. පහත නිරීක්ෂණයන් සිදුකරන ලදී.

| (අ) විගණනයේ බලපෑම | සාධකය | කළමනාකරණ ප්‍රතිචාරය | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| කොන්ත්‍රාත් පැකේජ 01 යටතේ ප්‍රමාණ පත්‍රයේ ඇතුලත් රු.මිලියන 134.32ක් වටිනා අයිතම 235ක වැඩ සහ කොන්ත්‍රාත් පැකේජ 03 යටතේ ප්‍රමාණ පත්‍රයේ ඇතුලත් රුපියල් මිලියන 189ක් වටිනා අයිතම 250ක වැඩ කොන්ත්‍රාත්කරු විසින් සිදුකර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් සිදු නොකරන ලද රුපියල් මිලියන 61.72ක වැඩ සඳහා සවලීකරණ අත්දැකීම ලබා දීමෙන් අමතර වාසියක් කොන්ත්‍රාත්කරුට ලබා ගැනීමට ඉඩ සැලසීම මගින් පෙනී යන්නේ කොන්ත්‍රාත් පැකේජවල ඉංජිනේරු ඇස්තමේන්තුව නිවැරදි ආකාරයට පිළියෙලකර නොමැති බවයි. | දුර්වල කොන්ත්‍රාත් පරිපාලනය නිසා කොන්ත්‍රාත් පිරිවැය වැඩිවීමට හා අරමුදල් අපතේ යාමට හැකිය. | ඇස්තමේන්තු සැලසුම් කරන අදියරේදී සකස්කර ඇත. ඉදිකාරීම් කලාපයේ පොලොව යට හා අනෙකුත් කලාපවල ප්‍රමාණවත් පරීක්ෂණ කටයුතු සිදු නොකර නිවැරදි ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමේ හැකියාවක් නොමැත. එම නිසා සමහර අයිතම් පූරොකථනය කිරීමට සිදුවතිබෙන අතර සමහර අයිතම් ඉදිකිරීම් අදියරේදී අවශ්‍ය නොවිය හැකිය. | පොළොව යට මිනුම් සහ අනෙකුත් පරීක්ෂණ ඇතුලත් විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යනයක් ඇස්තමේන්තු හා වැඩවල විෂය පථය තීරණය කිරීමට පෙර සිදු කිරීම අවශ්‍ය වේ. |
| (අ) කොන්ත්‍රාත් පැකේජ 02 යටතේ කිරුලපන - හෝමාගම මාර්ගය කැස්බෑව - පොකුණුවිට මාර්ගයන්ට අයත් කිලෝමීටර් 16.18 ක් පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2019/05/10 දින අවසන් කිරීමට සැලසුම්කර තිබුණු අතර මූලික විෂය පථයට අමතර වැඩ එකතුකල නිසා අවසන් කරන දිනය 2019 නොවැම්බර් 17 දක්වා දීර්ඝ කර තිබුණි. එයට අමතරව පසුව විෂය පථය වෙනස් කිරීම නිසා අඹතලේ සිට සිනෙක් හන්දිය දක්වා මාර්ගය කිලෝමීටර් 1.8 ක පුනරුත්ථාපන වැඩ දින 274 ක ප්‍රමාදයක් සහිතව 2018/12/31 වන විටත් අවසන්කර නොතිබුණි. | කාලය දීර්ඝ කිරීම හා අමතර වැඩ නිසා පිරිවැය ඉහල යාමට හැකියාවක් ඇත. | කොන්ත්‍රාත් පැකේජ 02 කොන්ත්‍රාත් වැඩ ප්‍රමාණවත් ලෙස සම්පූර්ණකර ඇති අතර කොන්ත්‍රාත් පැකේජ 04 යටතේ කොන්ත්‍රාත් වැඩ කෙරීගෙන යමින් පවතී. | අමතර පිරිවැය හා ප්‍රමාදය අවමකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |